16 සන්සුන් ගමනින් ලොව ම සැනසූ පොඩි හාමුදුරුවෝ

ධර්මාශෝක රජතුමාගේ සොහොයුරන් සිය දෙනා අතර වැඩිමහලු සොහොයුරා සුමන නම් විය. එතුමාගේ දේවිය ද සුමනා නම් වූවා ය.

පියාගේ ඇවෑමෙන් රාජ්‍ය බලය ලබා ගැනීමට ගිය අශෝක කුමාරයාට ඒ සඳහා තම සොහොයුරන් සිය දෙනා සමග දරුණු සටනක යෙදෙන්නට සිදු විය. එහි දී ඒ සුමන කුමාරයා ද ඇතුළු සොහොයුරෝ අනූනව දෙනෙක් මිය ගියහ. මේ වන විට සුමනා දේවිය සිටියේ ගැබ්බරව ය. තම සැමියා මරණයට පත් වීම නිසා අසරණ වූ ඇය දිවි බේරා ගැනීම සඳහා පාටලී පුත්‍ර නගරයේ නැගෙනහිර දොරටුවෙන් පිටත තිබූ සැඬොල් ගමකට පලා ගියා ය. සැඬොල් ගමේ ප්‍රධානියාගේ නිවස තිබුණේ නුග ගසක් අසල ය. ‘‘ ගැබ්බර බවත් ගමන් පීඩාවත් නිසා ඉන් ඔබ්බට යාමට අපොහොසත් වූ ඇය ඒ නුග ගස මුල නැවතුණා ය. ඇගේ තත්ත්වය දුටු ගම් ප්‍රධානියා කුටියක් තනා ඇයට සුව පහසුව සැලැස්විය. එද රෑ ම සුමනා දෙවිය පුත් කුමරෙකු බිහි කළා ය. නුග ගස යට දී උපන් නිසා ඔහුට නිග්‍රෝධ යැයි නම් තබන ලදි.

ගම් ප්‍රධානියා දේවියත් පුත් කුමරාත් ඉතා ගරු බුහුමන් සහිතව ඒ වගේ ම රහසිගතව සත් අවුරුද්දක් ම රැක බලා ගත්තේ ය. මහා වරුණ නම් රහතන් වහන්සේ නිතර මේ ගමට පිඬු පිණිස වඩිති. මේ කුඩා කුමරුවා උන් වහන්සේට දැන් හොඳට හුරු පුරුදු ය. ලැදි ය. මේ දරුවාට රහත් වීමට වාසනාව ඇති බව උන්වහන්සේ කල් ඇතිව ම දැන සිටි නමුත් ඒ සඳහා සුදුසු කාලය එන තුරු ඉවසා සිටියහ. දරුවෙකු පැවිදි කිරීමට නම් අඩුම තරමින් කපුටෙකු වත් එළවා ගැනීමට හැකියාව තිබිය යුතු ය. හත් හැවිරිදි විය පැවිද්දට ප්‍රමාණවත් ය. එනිසා වරුණ තෙරණුවෝ සුමනා දේවියගේ ද අවසරය ලබාගෙන කුමරු මොග්ගලී පුත්ත තිස්ස තෙරුන් වෙත කැඳවා ගෙන ගියහ. උන්වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා වරුණ තෙරුන්ගේ ආචාර්යත්වයෙන් නිග්‍රෝධ කුමරු පැවිදි විය. පැවිදි වන්නටත් පෙර හිස බූ ගා අවසන් වෙත් ම කුමරු රහත් විය.

නිග්‍රෝධ සාමණේරයන් වහන්සේට දිනක් මෑණියන් දැක බලා ගන්නට සිතුණි. ඇය තවමත් වෙසෙන්නේ සැඩොල් ගමේ ය. උන්වහන්සේ වෙසෙන විහාරයේ සිට ඒ ගමට යාමට දකුණු දොරටුවෙන් නුවරට පිවිස, රජ වාසල ඉදිරියෙන් ගමන් කොට, පැළ දොරින් නික්ම යා යුතු ය. මේ අසෝක රජතුමා කාලිංග යුද්ධයෙන් සිදු වූ විපත් නිසා බලවත් චිත්ත පීඩාවෙන් ගත කරන කාලය යි. එතුමාට හරි හැටි නින්දක් නැත. ආහාර රුචියක් නැත. රාජකාරි කළත් සතුටකින් නොවේ. ඉඩ ලැබෙන හැම විටක ම හුදකලාව කල්පනා කරමින් ගත කරයි. එතුමාගේ සිත සනසන්නට මෙතුවක් අධිරාජ්‍යයේ කිසිවෙකුට හැකිවී නැත. ඒ දවසේත් එතුමා සිටියේ බටහිර දෙසට මුහුණලා තිබුණු සඳළුතලයේ සක්මන් කරමිනි.

නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ පිරිමඬුළු කොට සිවුරු හැඳ පොරවා පා සිවුරු ගෙන බිමට හෙලු ඇස් ඇතිව, විය දඬු පමණ දුර බලමින් සන්සුන් ගමනින් වැඩම කරති. රජ මිදුල ඉදිරියෙන් ගමන් කරන මේ අපූරු කුඩා ශ්‍රමණ පුත්‍රයන් වහන්සේ එක් වර ම රජතුමාගේ නෙත ගැටුණි. මෙතෙක් මළානිකව තිබුණු රජුගේ සිත පිබිදී ආවේ ය. එතුමාට මෙසේ සිතුණි. '' සියලු මිනිසුන් බියෙන් සැළෙන මුවන් වැනි ය. ඔවුන්ගේ සිත් කළබල ය, විසුරුණේ ය. කුඩා වුවත් මේ ශ්‍රමණ පුත්‍රයා කළබල නොවූ නො විසිරුණු සිත් ඇති කෙනෙකි. මොහු ඉදිරිය බලන ආකාරය, වටපිට නොබලා යන ගමන ඉතා ප්‍රසන්න ය. මෙබඳු කුඩා වියේ සිටින වෙනත් ළදරුවන් මෙන් අත් පා ළෙලවීම්, සෙලවීම්, දිවීම්, පැනීම් කිසිවක් නැත. සත් හැවිරිදි කුඩා දරුවෙකුට මෙතරම් සන්සුන් කමක් ලැබෙන්නේ ඔහු තුළ ලොව්තුරා දහමක් තිබෙන නිසා ම ය. එහි සැකයක් නැත. '' මෙසේ නිග්‍රෝධ සාමණේරයන් කෙරෙහි උපන් ප්‍රසාදය නිසා ම රජතුමාගේ සිතේ කණස්සල්ල ද වහා පහව ගියේ ය.

ඇමතිවරයෙකු ඇමතූ රජතුමා '' පින්වත! අර මහ මග වඩින කුඩා ශ්‍රමණ පුත්‍රයන් වහන්සේ ගරු බුහුමන් ඇති ව මෙහි වැඩමවාගෙන එන්නැ'' යි නියම කළේ ය. ඇමතිවරයා වහා පොඩි හාමුදුරුවන් වෙත ගොස් රජතුමාගේ ආරාධනය දන්වා සිටියේ ය. උන් වහන්සේ ඇමතිවරයා සමග රජ ගෙට පිවිසියහ. රජතුමා ගරු බුහුමන් දක්වා සුදුසු අසුනක වැඩ හිඳිනු මැනවැයි ඉල්ලා සිටියේය. උන්වහන්සේ වටපිට බැලූහ. වෙනත් කිසිදු භික්ෂූන් වහන්සේ නමක් එහි නොවී ය. දැන් මෙහි උසස් ම අසුනේ හිඳීමට සිටින එක ම සුදුස්සා තමා බව උන්වහන්සේට වැටහිණ. ඒ නිසා පොඩි හාමුදුරුවෝ සිහසුන

වෙතට වැඩම කළහ. එයින් රජතුමා තවත් පැහැදුණි. එහෙත් හිඳ ගන්නට උස නැත. රජතුමා ඉතා ගෞරවයෙන් උන්වහන්සේ සිංහාසනය මත හිඳුවී ය.

අනතුරුව මහ රජතුමා තමා සඳහා පිළියෙළ කර තිබුණු කැඳ අවුළුපත් ආදී රජ බොජුන් සාමණේර පොඩි හාමුදුරුවන්ට පිළිගැන්වී ය. උන්වහන්සේ තමන්ට යැපිය හැකි තරමට පිළිගෙන සේබියාවල කී ලෙසින් ඉතා ම ආචාර සම්පන්නව සන්සුන් ව වැළඳූහ. වළඳා අවසන් වූ සාමණේරයන් වෙත ගොස් එකත් පසෙක හිඳගත් රජතුමා '' ඔබ වහන්සේගේ ශාස්තෘන් වහන්සේ දෙසූ දහමක් දන්නා සේක්දැ '' යි විමසීය. මහරජ! තරමක් දනිමි'' යි උන්වහන්සේ පැවසූහ. ස්වාමීනි, එසේ නම් ඒ දන්නා තරම මට කියා දෙනු මැනවැයි රජතුමා කීය. උන්වහන්සේ ධම්ම පදයේ අප්පමාද වග්ගයේ සඳහන් වන

අප්පමාදො අමත පදං
පමාදො මච්චුනො පදං
අප්පමත්තා න මීයන්ති
යෙ පමත්තා යථා මතා

යන ගාථාවෙන් '' මහරජ, කුසල දහමෙහි නොපමාව යෙදීම නිවනට මග යි. පස් කම් සැපයෙහි යෙදී ප්‍රමාද වීම මැරි මැරී උපදින සසරට මග යි. අප්‍රමාද වූවෝ මරණයෙන් මිදෙති. ප්‍රමාද වූවෝ ජීවත් වූවත් මළවුන් වැනියැයි. කියා රජතුමාට දහමක් දෙසූහ. රජතුමා එයින් හොඳට ම පැහැදුණේ ය. සිතේ කණස්සල්ල සහ මුලින් සිඳී ගියේ ය. ඉතා ප්‍රීතියට පත් රජතුමා "ස්වාමීනි ! මම ඔබ වහන්සේට නිති පතා බත් වර අටක් පුදමි"යි. තමා සමග අට නමකට රජ ගෙදර දන් වළඳන්නට පැවරුම් කළේ ය. පොඩි හාමුදුරුවෝ එය තමන් නොපිළිගෙන මහරජ ඒ බත් වර අට මම මගේ උපාධ්‍යායන් වහන්සේට පුදමියි කීය. උපාධ්‍යායන් වහන්සේ නම් කවුරුන් දැයි රජතුමා ඇසීය. මහරජ, මා පැවිදි කොට ලොකු කුඩා වරද නිවරද දැක චෝදනා හෝ ප්‍රශංසා කරමින් කරුණු කාරණා තීරණය කරන්නේ උපාධ්‍යායන් වහන්සේ ය. ඒ මාගේ උපාධ්‍යායන් වහන්සේ නම් මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ යැයි '' කීහ. හොඳයි, ඒ බත් අට උන්වහන්සේට වේවා. ඔබ වහන්සේට තවත් බත් අටක් දෙමි. එවිට සාමණේරයන් වහන්සේ එය මගේ ආචාර්යයන් වහන්සේට පුදමියි කීය. එවිට රජතුමා ආචාර්යයන්

වහන්සේ නම් කවුරුදැයි ඇසී ය. "අප වත් පිළිවෙත්වල හික්මවන්නේ ආචාර්යයන් වහන්සේ ය. ඒ මාගේ ආචාර්යයන් වහන්සේ නම් වරුණ මහ රහතන් වහන්සේ යැ"යි පොඩිහාමුදුරුවෝ කීය. "හොඳයි එය උන්වහන්සේට වේවා. මම තවත් බත් අටක් දෙමි''යි රජු පැවසී ය. "මහරජ, ඒ අට සංඝයාට දෙන්නැ'යි පොඩිහාමුදුරුවෝ පැවසී"ය. එවිට රජතුමා "ස්වාමීනි, සංඝයා නම් කවුරුද'යි ඇසීය. "මහරජ, අප ආචාර්ය උපාධ්‍යායන් වහන්සේගෙත් මාගෙත් පැවිද්ද හා උපසම්පදාව සම්මත කරන්නේ ඒ භික්ෂු සංඝයා යැ"යි සාමණේරයන් වහන්සේ පැවසූහ.

අනතුරු ව සාමණේරයන් වහන්සේ මහ රජතුමා ඇතුළු පිරිස තිසරණ සහිත පංච සීලයේ පිහිටුවූහ. එතැන් පටන් අශෝක රජතුමා සහ පිරිස බෞද්ධ උපාසකයන් බවට පත්වූහ. අශෝක රජතුමා මේ කුඩා ශ්‍රමණයන් වහන්සේගේ සන්සුන්කමට හා හුරුබුහුටිකමටත්, ව්‍යක්ත කමටත් ආත්මගෞරවය සංඝ ගෞරවය ආදී ගුණවත් කමටත් අතිශයින් ම පැහැදී තවත් බත් වර අටක් පුද දුන්නේ ය. උන් වහන්සේ එය තමන් සඳහා පිළිගෙන පසුදා තමනුත් ආචාර්යයන්, උපාධ්‍යායන් වහන්සේලාත් ඇතුළු දෙතිස් නමක් රජ ගෙදරට වැඩියහ. රජතුමා සියතින් ම දන් පිළිගන්වා හෙට තවත් දෙතිස් නමක් සමග වඩිනු මැනවැයි ඇරයුම් කළේ ය. මෙසේ දවසින් දවස රජ මාලිගයේ දන් වළඳන භික්ෂු සංඛ්‍යාව දෙගුණ තෙගුණ වී ගියේ ය. අන්තිමේදී රජතුමා නිග්‍රෝධ සාමණේරයන් වහන්සේට පැහැදුණ නිසා රජ ගෙදරින් දන් වළඳන භික්ෂූහු හැට දහසක් වූහ. මේ ආකාරයෙන් නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ තිබූ නොපැහැදුණ වුන් පහදවනසුලු සන්සුන් ගුණය නිසාත් ව්‍යක්ත ධර්ම කථිකත්වය නිසාත්, උතුම් ගුණ ධර්ම නිසාත් චණ්ඩා ශෝක රජතුමා ධර්මාශෝක කෙනෙකු බවට පත් විය. එතුමා ධර්මාශෝක වීම නිසා ඉන්දියාවට සීමා වී තිබුණ බුදුදහම ලෝක ආගමක් බවට පත් විය.

අදත් අප මේ භුක්ති විඳින්නේ එහි උතුම් ඵලය යි. එදා ඒ නිග්‍රෝධ පොඩි හාමුදුරුවන්ගේ සංවරකම නොවන්නට අද මේ සියල්ල අපට අහිමි වන්නටත් ඉඩ තිබුණේ ය.

අභ්‍යාස

01. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේට එම නම ලැබුණේ කෙසේ ද?

02. අශෝක රජතුමා උන්වහන්සේට පැහැදුණු හේතු තුනක් කියන්න.

03. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගෙන් අපට උගත හැකි පාඩම් දෙකක් කියන්න.